PAFFREL
නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.
சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.
PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS

# මාධ්‍ය නිවේදනය

**2026 ඔක්තෝබර් 22**

**කොළඹ**

## "තවදුරටත් ප්‍රමාදයකින් තොරව පළාත් සභා මැතිවරණ පවත්වන ලෙසත්, ඡන්දදායකයන්ගේ අයිතිවාසිකම් සුරැකීම සඳහා විකල්ප ඡන්ද ක්‍රමයක් අත්හදා බලන නියමු වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලෙසත් පැෆ්රල් සංවිධානය ඉල්ලා සිටී"

*විකල්ප ඡන්ද ක්‍රමය පිළිබඳ දේශපාලන පක්ෂවල අදහස් ඉදිරිපත් කරමින්, ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගන්නා ලෙස PAFFREL රජයෙන්, අදාළ අමාත්‍යාංශවලින් සහ වගකිවයුතු ආයතනවලින් ඉල්ලා සිටී.*

කොළඹ - නිදහස් හා සාධාරණ මැතිවරණ සඳහා වූ ජනතා ක්‍රියාකාරීත්වය (පැෆ්රල් සංවිධානය) අද දින පාර්ලිමේන්තුවෙන්, අදාළ අමාත්‍යාංශවලින් සහ මැතිවරණ සම්බන්ධයෙන් වගකීම දරන ආයතනවලින් ඉල්ලා සිටියේ, දිගු කලක් තිස්සේ ප්‍රමාද වී ඇති පළාත් සභා මැතිවරණ තවදුරටත් ප්‍රමාදයකින් තොරව පවත්වන ලෙසත්, ඉන් අනතුරුව පැවැත්වෙන පළාත් සභා මැතිවරණය ඇතුළු අනෙකුත් මැතිවරණවලදී විකල්ප ඡන්ද ක්‍රමයට අදාළ විධිවිධාන හඳුන්වා දෙමින් ඒවා අත්හදා බැලීමේ නියමු වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලෙසත්ය.සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍ය නියෝජනය කරන මාධ්‍යවේදීන් සඳහා පැවැත්වූ මාධ්‍ය හමුවකදී පැෆ්රල් සංවිධානය මෙම ඉල්ලීම ඉදිරිපත් කළේය. එහිදී විකල්ප ඡන්ද ක්‍රමය සම්බන්ධයෙන් දේශපාලන පක්ෂ සමඟ සිදුකළ සාකච්ඡාවලින් අනාවරණය වූ කරුණු සහ එම පක්ෂ විසින් ඉදිරිපත් කරන ලද අදහස් ද පැෆ්රල් සංවිධානය විසින් මාධ්‍ය වෙත ඉදිරිපත් කරන ලදී.

### පළාත් සභා මැතිවරණ: තාක්ෂණික ගැටලුවක් නොව, දේශපාලන තීරණයකි

අවසන් වරට පළාත් සභා මැතිවරණයක් පවත්වා මේ වන විට දශකයකට වැඩි කාලයක් ගත වී ඇත. මහජන ඡන්දයෙන් තේරී පත් වූ නියෝජිතයන් නොමැති වීම හේතුවෙන්, පළාත් සභා ආණ්ඩුකාරවරුන් යටතේ ක්‍රියාත්මක වේ.

වත්මන් ආණ්ඩු පක්ෂයේ 2024 අගෝස්තු මාසයේ ප්‍රකාශයට පත් කළ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ, දැනට දින නියමයක් නොමැතිව කල්තබා ඇති පළාත් සභා සහ පළාත් පාලන මැතිවරණ වසරක් ඇතුළත පවත්වා, ජනතාවට පාලනයට සම්බන්ධ වීමට අවස්ථාව ලබාදීම සඳහා වසරක් ඇතුළත එම මැතිවරණ පවත්වන බවට (පි, 230/ සිංහල පිටපත) ප්‍රතිඥා දී තිබිණි. ඒ අනුව, 2025 මැයි මාසයේදී පළාත් පාලන ආයතන මැතිවරණ පැවැත්වුවද, වත්මන් ආණ්ඩුව බලයට පත්වී වසර දෙකකට වැඩි කාලයක් ගත වී ඇතත් පළාත් සභා මැතිවරණ තවමත් පවත්වා නොමැත. ආණ්ඩුවේ ධුර කාලයෙන් වසර දෙකක් ගත වී තිබියදීත්, දිගු කලක් තිස්සේ ප්‍රමාද වී ඇති පළාත් සභා මැතිවරණ පැවැත්වීම සඳහා පැහැදිලි කාලසටහනක් ප්‍රකාශයට පත් කිරීමට හෝ දෘශ්‍යමාන සූදානමක් පෙන්වීමට හෝ ආණ්ඩුව මෙතෙක් සමත් වී නොමැත.

තාක්ෂණික ගැටලු මතු කරමින් මැතිවරණ අඛණ්ඩව කල් දැමීම සඳහා ආණ්ඩු තුනක්ම එම කරුණු මෙවලමක් ලෙස භාවිත කර ඇත. එහෙත් පළාත් සභා මැතිවරණ පැවැත්වීමට අවශ්‍ය වන්නේ දේශපාලන තීරණයකි. ආණ්ඩුව ඒ සඳහා තීරණයක් ගන්නේ නම්, අවශ්‍ය නීති සංශෝධන මාස තුනක පමණ කාලයක් තුළ සිදු කළ හැකිය.

#No.16, Byrde Place, Off Pamankada Rd, Colombo 06.
Tel : (+94) 11 2558570 / 11 2558571 Fax : (+94) 11 2558572
Email : paffrel@sltnet.lk Web : www.paffrel.com

2026 මැයි 26 වැනි දින පැෆ්රල් සංවිධානය විසින් මැතිවරණ කඩිනමින් පැවැත්විය හැකි ආකාරය පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා දේශපාලන පක්ෂ සහ සිවිල් සමාජ සංවිධාන කොළඹදී එක්රැස් කරන ලදී. එම සාකච්ඡාවට සහභාගී වූ එක් දේශපාලන පක්ෂයක් හැර අනෙකුත් සියලුම පක්ෂ ඒකාබද්ධ ප්‍රකාශනයකට අත්සන් තබමින් එකඟතාව පළ කළේ, පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේ අවසන් තීරණය ලැබෙන තෙක් 2017 අංක 17 දරන පනතට පෙර පැවති මැතිවරණ ක්‍රමය යටතේ පළාත් සභා මැතිවරණ පැවැත්වීමටත්, ස්වේච්ඡා පදනමක් මත කාන්තාවන්ට සහ තරුණයන්ට 25%ක නියෝජනයක් සහතික කිරීමටත්ය. මෙම සාකච්ඡාවට ආණ්ඩු පක්ෂයේ නියෝජිතයෙකු මෙන්ම පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව නියෝජනය කරන විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සිව්දෙනා ද සහභාගී වූහ. අදාළ ඒකාබද්ධ ප්‍රකාශනය පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවට සහ ආණ්ඩුවට ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි.

## විකල්ප ඡන්ද ක්‍රමයː දේශපාලන පක්ෂ පැෆ්රල් සංවිධානය වෙත ඉදිරිපත් කළ අදහස්

මැතිවරණ දිනයේදී ඡන්ද මධ්‍යස්ථානයට පැමිණීමට නොහැකි වීම හේතුවෙන් කිසිදු සුදුසුකම්ලත් ඡන්දදායකයෙකුට තම ඡන්ද අයිතිය අහිමි නොවිය යුතුය. එම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා විකල්ප ඡන්ද ක්‍රම හඳුන්වාදීම පිළිබඳව පැෆ්රල් සංවිධානය දිවයින පුරා පිළිගත් දේශපාලන පක්ෂ සහ අලුතින් පිහිටුවන ලද දේශපාලන පක්ෂ හා කණ්ඩායම් සමඟ සාකච්ඡා පවත්වා ඇත. රැකියාමය වගකීම්, සෞඛ්‍ය ගැටලු, රඳවා තබා සිටීම, ඡන්ද මධ්‍යස්ථානයට ඇති දුරස්ථභාවය හෝ රාජකාරිමය වගකීම් වැනි හේතු නිසා ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වන පුද්ගලයන්ට ද තම ඡන්ද අයිතිය භාවිත කිරීමට අවස්ථාව සැලසීම මෙම යෝජනාවල ප්‍රධාන අරමුණයි. මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති යෝජනා පහක් පිළිබඳව දේශපාලන පක්ෂ 23ක් දැක්වූ අදහස් පැෆ්රල් සංවිධානය විසින් විශ්ලේෂණය කර ඇත. මෙම විශ්ලේෂණය සඳහා පදනම් වී ඇත්තේ අදාළ දේශපාලන පක්ෂ හා කණ්ඩායම් සමඟ පැවැත්වූ සාකච්ඡාවලදී රැස්කරගත් තොරතුරු සහ දත්තය. පැෆ්රල් සංවිධානය දශකයකට වැඩි කාලයක් පුරා විකල්ප ඡන්ද ක්‍රම හඳුන්වාදීම වෙනුවෙන් පෙනී සිටින අතර, මැතිවරණ දිනයේදී ඡන්ද මධ්‍යස්ථානයකට ළඟාවීමට නොහැකි වීම හේතුවෙන් ශ්‍රී ලංකාව තුළ ජීවත් වන ඡන්දදායකයන් මිලියනයකට ආසන්න සංඛ්‍යාවකට සිය ඡන්දය ප්‍රකාශ කිරීමේ අවස්ථාව අහිමි වන බවට හඳුනාගෙන ඇත.

- තැපැල් ඡන්දයː දේශපාලන පක්ෂ 23න් 22ක් (96%) දැනට මැතිවරණ රාජකාරිවල නිරත වන රාජ්‍ය සේවකයන්ට පමණක් සීමා වී ඇති තැපැල් ඡන්ද අයිතිය පුළුල් කිරීමට එකඟතාව පළ කළහ. එක් පක්ෂයක් ඊට එකඟ නොවීය. පෞද්ගලික අංශයේ සහ නිදහස් වෙළෙඳ කලාපවල සේවකයන්, රක්ෂිත බන්ධනාගාරගතව සිටින සැකකරුවන්, රෝහල්ගතව සිටින රෝගීන්, ආබාධ සහිත පුද්ගලයන්, මැතිවරණ නිරීක්ෂකයන්, මාධ්‍යවේදීන් සහ ආරක්ෂක අංශ සාමාජිකයන්ට මෙන්ම විදේශගත ශ්‍රමිකයන්ට, ද්විත්ව පුරවැසියන්ට සහ සරණාගතයන්ට ද තැපැල් ඡන්ද පහසුකම පුළුල් කිරීම පිළිබඳව පක්ෂ විසින් යෝජනා ඉදිරිපත් කරන ලදී. කිසිදු වරදකට වරදකරු කරනු නොලැබූවන් වන රක්ෂිත බන්ධනාගාරගත සැකකරුවන් මෙම පහසුකමෙන් බැහැර කිරීම විශේෂයෙන් සාධාරණීකරණය කිරීම දුෂ්කර කරුණක් ලෙස පෙන්වා දිය හැකිය.
- පූර්ව ඡන්දය ප්‍රකාශ කිරීම, විකල්ප ඡන්ද මධ්‍යස්ථාන, ජංගම ඡන්ද පහසුකම් සහ විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ ඡන්ද අයිතියː මෙම යෝජනා කිසිවකට විරුද්ධත්වය පළ කළ දේශපාලන පක්ෂයක් නොවීය. කෙසේ වෙතත්, මෙම යෝජනා සම්බන්ධයෙන් තම ස්ථාවරය ප්‍රකාශ කළ පක්ෂ සංඛ්‍යාව සාපේක්ෂව අඩු විය. ජංගම කණ්ඩායම් මඟින් විවිධ ස්ථාන වෙත ගොස් ඡන්දය ලබාගැනීමට වඩා, බන්ධනාගාර සහ රෝහල් වැනි ස්ථානවල ස්ථිර හෝ තාවකාලික ඡන්ද මධ්‍යස්ථාන පිහිටුවීම වඩාත් සුදුසු බවට පක්ෂ වැඩි කැමැත්තක් දැක්වූහ. විදේශගතව සිටින ශ්‍රී ලාංකිකයන්ගේ ඡන්දය ප්‍රකාශ කිරීම සම්බන්ධයෙන් සයිබර් ආරක්ෂාව, තානාපති කාර්යාල මට්ටමේ පරිපාලන කටයුතු, මැතිවරණ ප්‍රචාරණයේ සාධාරණත්වය සහ ඡන්ද ක්‍රියාවලිය නිරීක්ෂණය කිරීම පිළිබඳ ගැටලු ද පක්ෂ විසින් මතු කරන ලදී.

යෝජනා එකින් එක සලකා බැලීමේදී, තැපැල් ඡන්ද අයිතිය පුළුල් කිරීම සඳහා ඉහළම සහයෝගය හිමි වී ඇති අතර, එය ක්‍රියාත්මක කිරීම සඳහා ඉදිරියට ගෙන යා හැකි යෝජනාවක් බව පැහැදිලි වේ. දේශපාලන පක්ෂ 23න් 22ක්ම (96%) ඒ සඳහා එකඟතාව පළ කර ඇත. පූර්ව ඡන්දය ප්‍රකාශ කිරීම සහ විකල්ප ඡන්ද මධ්‍යස්ථාන පිහිටුවීම සම්බන්ධයෙන් තම ස්ථාවරය ප්‍රකාශ කළ සියලුම පක්ෂ එකඟතාව පළ කර ඇති අතර, කිසිදු පක්ෂයක් ඊට විරුද්ධ වී නොමැත. කෙසේ වෙතත්, විදේශගත ඡන්දදායකයන් සඳහා පූර්ව ඡන්ද ක්‍රමය ක්‍රියාත්මක කරන ආකාරය තවමත් පැහැදිලි නැති අතර, විකල්ප ඡන්ද මධ්‍යස්ථාන සම්බන්ධයෙන් ආරක්ෂාව සහ නිරීක්ෂණය පිළිබඳ ගැටලු ද පවතී. ජංගම ඡන්ද මධ්‍යස්ථාන සඳහා සාපේක්ෂව අඩු සහයෝගයක් හිමි වී ඇති අතර, එක් දේශපාලන පක්ෂයක් එය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ නොහැකි යෝජනාවක් ලෙස පෙන්වා දී ඇත. ඒ වෙනුවට ස්ථිර හෝ තාවකාලික ඡන්ද මධ්‍යස්ථාන පිහිටුවීම වඩාත් සුදුසු බවට පක්ෂ කැමැත්ත පළ කර තිබේ. විදේශගත ශ්‍රී ලාංකිකයන්ට ඡන්ද අයිතිය ලබාදීමේ මූලධර්මයට එකඟතාව පළ වී තිබුණ ද, ඒ සඳහා වන ක්‍රියාකාරී ක්‍රමවේදය මෙතෙක් තීරණය කර නොමැත.

දේශපාලන පක්ෂවල අදහස් ප්‍රධාන කාණ්ඩ හතරකට වර්ග කළ හැකිය. පක්ෂ 13ක් නිශ්චිත කොන්දේසි ඉදිරිපත් කිරීමකින් තොරව ඡන්ද අයිතිය පුළුල් කිරීමට එකඟතාව පළ කළහ. තවත් පක්ෂ පහක් විදේශගත පුරවැසියන්,

විදෙස්ගත ශ්‍රී ලාංකික ප්‍රජාව සහ ද්විත්ව පුරවැසියන් ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රියාවලියට ඇතුළත් කිරීමේ වැදගත්කම අවධාරණය කළහ. පක්ෂ තුනක් පරිගණක පද්ධතිවල ආරක්ෂාව, මහජන විශ්වාසය නොමැති වීම, මැදපෙරදිග රටවල සේවය කරන ශ්‍රමිකයන්ට ඡන්දය ප්‍රකාශ කිරීමේ පහසුකම් සැලසීමේ ප්‍රායෝගික හැකියාව සහ විදේශගතව සිටින සියලුම පක්ෂවලට සමාන මැතිවරණ ප්‍රචාරක අවස්ථා ලබාදීම වැනි ප්‍රායෝගික ගැටලු මතු කළහ. එක් පක්ෂයක් යෝජනාවලට එකඟ නොවීය. ඇතැම් පක්ෂ කරුණු එකකට වැඩි සංඛ්‍යාවක් ඉදිරිපත් කර ඇති බැවින්, මෙම කාණ්ඩ එකිනෙකින් සම්පූර්ණයෙන් වෙන් වූ කාණ්ඩ ලෙස නොසැලකිය යුතුය.

වත්මන් ආණ්ඩු පක්ෂයේ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ද මේ සම්බන්ධයෙන් පොරොන්දු ඇතුළත් වේ. එහි රැකියා සඳහා රට තුළ සහ රටින් පිටත සංක්‍රමණික පුද්ගලයන්ගේ ඡන්ද අයිතිය තහවුරු කිරීම (පි, 194/සිංහල පිටපත) මෙන්ම විදේශ රැකියාවල නියුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ට තමන් පදිංචි රටෙහි සිට ඡන්ද භාවිතා කිරීමට පහසුකම් සැලසීම (පි, 221/සිංහල පිටපත) පිළිබඳවත් ප්‍රතිඥා ලබා දී ඇත.

2025 සැප්තැම්බර් 15 වැනි දින පැවති කැබිනට් මණ්ඩල තීරණය මඟින් විදෙස්ගත ශ්‍රී ලාංකිකයන්ට ඡන්දය ප්‍රකාශ කිරීමට හැකි වන ආකාරයෙන් නීති සකස් කිරීමට රජය දක්වා ඇති අභිලාෂය පැෆ්රල් සංවිධානය අගය කරයි. එම තීරණය මඟින් දැනට පවතින නීති සංශෝධනය කිරීම හෝ නව නීති සකස් කිරීම පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ සහ අදාළ අමාත්‍යාංශවල නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත් කිරීම අනුමත කර තිබිණි. ඉන්දියාව, බංග්ලාදේශය සහ පිලිපීනය යන රටවල් දැනටමත් විදේශගතව සිටින තම පුරවැසියන්ට ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව සලසා ඇති බව ද එහි සඳහන් විය.

මෙම ප්‍රතිඥාව නීතිමය විධිවිධාන බවට පත් කරමින් ක්‍රියාත්මක කරන ලෙස පැෆ්රල් සංවිධානය රජයෙන් ඉල්ලා සිටී. එමෙන්ම, රට තුළ ජීවත් වන නමුත් විවිධ හේතු මත මැතිවරණ දිනයේදී ඡන්ද මධ්‍යස්ථානයකට පැමිණීමට නොහැකි වන ඡන්දදායකයන් සම්බන්ධයෙන් ද එම ප්‍රවේශය අනුගමනය කළ යුතු බව පැෆ්රල් සංවිධානය අවධාරණය කරයි.

මෙම ප්‍රතිඥා පැෆ්රල් සංවිධානය විසින් ඉහළින් පිළිගනු ලබන අතර, ඉදිරියේදී පැවැත්වීමට නියමිත පළාත් සහා මැතිවරණය ඒවා ක්‍රියාවට නැංවීම ආරම්භ කිරීමට ලැබෙන පළමු අවස්ථාව වේ.

## පැෆ්රල් සංවිධානයෙහි ප්‍රධාන ඉල්ලීම් සහ නිර්දේශ

1. **රජය වෙත:** පළාත් සභා මැතිවරණ පැවැත්වීම සම්බන්ධයෙන් කඩිනමින් දේශපාලන තීරණයක් ගෙන, මැතිවරණ පැවැත්වීම සඳහා නිශ්චිත දිනයක් හෝ කාලසීමා සහිත පැහැදිලි ක්‍රියාමාර්ග සැලැස්මක් ප්‍රකාශයට පත් කළ යුතුය. තවදුරටත් කමිටු පත් කිරීම හෝ තාක්ෂණික කරුණු මත ප්‍රමාද කිරීමකින් තොරව, මැතිවරණ පැවැත්වීමට අවශ්‍ය නීති සංශෝධන කඩිනමින් ඉදිරිපත් කර ක්‍රියාත්මක කළ යුතුය.

2. පාර්ලිමේන්තුව සහ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව වෙත: පළාත් සභා මැතිවරණ ක්‍රමය සම්බන්ධයෙන් ඉදිරිපත් කිරීමට නියමිත නිර්දේශ කඩිනමින් අවසන් කළ යුතු අතර, දේශපාලන පක්ෂ අතර ඇති කරගත් එකඟතාවට අනුව කාන්තා සහ තරුණ නියෝජනය 25%ක් සහතික කිරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය.

3. රජය සහ මැතිවරණ කොමිෂන් සභාව වෙත: පළාත් සභා මැතිවරණ සඳහා විකල්ප ඡන්ද ක්‍රම හඳුන්වාදීමට අවශ්‍ය විධිවිධාන ද අදාළ නීති සංශෝධනවලට ඇතුළත් කළ යුතුය. ඒ යටතේ, පළමුව තැපැල් ඡන්ද පහසුකම් පුළුල් කිරීමත්, තෝරාගත් ප්‍රදේශවල පූර්ව ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රම සහ විකල්ප ඡන්ද මධ්‍යස්ථාන පිහිටුවීමේ නියමු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් සිදු කළ යුතුය.

4. අදාළ අමාත්‍යාංශ සහ ආයතන වෙත: පළාත් සභා, අධිකරණ සහ බන්ධනාගාර, සෞඛ්‍ය, කම්කරු සහ විදේශ රැකියා යන විෂයයන්ට අදාළ අමාත්‍යාංශ සහ ආයතන මෙන්ම නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව ද මැතිවරණ කොමිෂන් සභාව සමඟ එක්ව කටයුතු කළ යුතුය. ඒ මඟින් රක්ෂිත බන්ධනාගාරගත සැකකරුවන්ට, රෝහල්ගත රෝගීන්ට, ආබාධ සහිත පුද්ගලයන්ට, පෞද්ගලික අංශයේ සේවකයන්ට, මාධ්‍යවේදීන්ට, මැතිවරණ නිරීක්ෂකයන්ට සහ ආරක්ෂක අංශ සාමාජිකයන්ට ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසිය යුතුය. එමෙන්ම, පෞද්ගලික අංශයේ සේවකයන්ට ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා අවස්ථාව සැලසීමට මැතිවරණ දිනයට පෙර අවම වශයෙන් දින දෙකක නිවාඩුවක් ලබාදීමේ යෝජනාව ද සලකා බැලිය යුතුය.

5. මැතිවරණ කොමිෂන් සභාව වෙත: විකල්ප ඡන්ද ක්‍රම සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරන ඕනෑම නියමු වැඩසටහනක් සඳහා පැහැදිලි සුදුසුකම් නිර්ණායක, විනිවිදභාවයෙන් යුත් ක්‍රියාපටිපාටි සහ ස්වාධීන නිරීක්ෂණ ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතුය. එමෙන්ම, වැඩසටහනේ ප්‍රතිඵල සහ ඇගයීම් සොයාගැනීම් ඇතුළත් වාර්තාවක් ප්‍රසිද්ධියට පත් කළ යුතු අතර, එමඟින් ලබාගන්නා අත්දැකීම් අනාගත මැතිවරණවලදී මෙම ක්‍රම වඩාත් පුළුල් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගත යුතුය.

සුදුසුකම්ලත් කිසිදු පුරවැසියෙකුට තමන් සේවය කරන ස්ථානය, රඳවා සිටින ස්ථානය හෝ පදිංචි ස්ථානය හේතුවෙන් ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය අහිමි නොවිය යුතු බව පැෆ්රල් සංවිධානය අවධාරණය කරයි. මෙම විකල්ප ඡන්ද ක්‍රම පළාත් සභා මැතිවරණවලදී නියමු වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක කිරීමෙන්, ඒවා රට පුරා ව්‍යාප්ත කිරීමට පෙර අවශ්‍ය ආරක්ෂණ ක්‍රියාමාර්ග අත්හදා බලා ඇගයීමට අවස්ථාව සැලසෙනු ඇත.




රෝහණ හෙට්ටිආරච්චි
විධායක අධ්‍යක්ෂ
නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා වූ ජනතා ක්‍රියාකාරිත්වය (පැෆ්රල්)
නො. 16, බයර්ඩ් පෙදෙස, පාමංකඩ පාර, කොළඹ 06
ජංගම දුරකථන: +94 77 759 0154
දුරකථන: +94 11 2558570 / +94 11 2558571
ෆැක්ස්:+94 11 2558572
විද්‍යුත් තැපැල: paffrel@sltnet.lk
වෙබ් අඩවිය: www.paffrel.com